# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.15 පැය 0730 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/740 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාතර්ා වූ වැදගත් තොරතුරු**

## 01. මාරක රිය අනතුරක් - මැල්සිරිපුර පොලිස් වසම.

2025.04.14 වන දින රාත්‍රී කාලයේ මැල්සිරිපුර පොලිස් වසමේ ත්‍රිකුණාමලය අඹේපුස්ස මාගර්යේ පන්ලියද්ද ප්‍රදේශයේදී දඹුල්ල දෙස සිට කුරුණෑගල දෙසට ධාවනය වූ ත්‍රීරෝද රථයක් මාගර්යේ සිටි ගවයෙකුගේ ගැටී ත්‍රීරෝද රථය පෙරළීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් ත්‍රීරෝද රථයේ රියදුරු බරපතල තුවාල ලබා ගලේවෙල රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 54 ක් වූ තිහාරිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය ගලේවෙල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. මැල්සිරිපුර පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 02. මාරක රිය අනතුරක් - ඇල්පිටිය පොලිස් වසම.

2025.04.15 වන අද දින අළුයම් කාලයේ ඇල්පිටිය පොලිස් වසමේ ඇල්පිටිය අම්බලන්ගොඩ මාගර්යේ කුරුඳුගහ නගරයේදී අම්බලන්ගොඩ දෙස සිට ඇල්පිටිය දෙසට ධාවනය වූ ත්‍රීරෝද රථයක් ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි වෑන් රථයක ගැටීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ ත්‍රීරෝද රථයේ රියදුරු, පිටුපස අසුනේ ගමන් කළ පිරිමි පුද්ගලයෙකු, කාන්තාවන් දෙදෙනෙකු සහ ගැහැණු දරුවන් තිදෙනෙකු ඇල්පිටිය රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී එක් ගැහැණු දරුවෙකු මියගොස් ඇති අතර සෙසු තුවාලකරුවන් ඇල්පිටිය රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබයි.

**මියගිය ගැහැණු දරුවා වයස අවුරුදු 06 ක් වූ කුරුඳුවත්ත, පිටිගල ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය ඇල්පිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුරට සම්බන්ධ වෑන් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර ඇල්පිටිය පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**